# ‘සාගර ආරක්ෂාව: දකුණු ආසියාව සහ ඉන්දියානු සාගරය’ සමුළුවේදී තානාපතිනි ජුලී ජේ. චංග් තානාපතිතුමිය විසින් පල කළ අදහස්

2023 ඔක්තෝම්බර් 16

සුබ උදෑසනක් වේවා!  මා මෙහි පැමිණියේ ඉතා සතුටින්, අද මෙහි පැමිණි ඔබ සැම සාදරයෙන් පිළිගන්නවා, විශේෂයෙන්ම අපගේ එක්සත් ජනපද සාම ආයතනයේ සගයන් වන නිලන්ති සමරනායක, ආචාර්ය ඩැනියෙල් මාර්කි, වොෂින්ටන් ඩීසී සිට අප හා එක්වීමට පැමිණි ආචාර්ය අස්ෆාන්-ඩියාර් මිර්. විදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් යසෝජා ගුණසේකර සහ මහාචාර්ය සංජය චතුර්වේදි ද සාදරයෙන් පිළිගන්නවා. අද අප හා එක්වන මගේ රාජ්‍ය තාන්ත්‍රිකයින් සගයන් ද පිළිගැනීමට ලක් කරනවා.

සමුළුවේ සංවිධායකයින් වන, ක්‍රමෝපායික අධ්‍යයනය සඳහා වන කලාපීය මධ්‍යස්ථානයේ මහාචාර්ය නයනි මැලෑගොඩ සහ ආචාර්ය ජෝර්ජ් කුක් වෙත මෙන්ම, ප්‍රදර්ශනය කිරීම සඳහා හොඳම සාරාංශ තෝරාගැනීමට අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කළ සැසිවාර සභාපතිවරුන් වෙත විශේෂ ස්තුතියක් පල කළ යුතු වනවා.

අවසාන වශයෙන්, අදදින ඉදිරිපත් කිරීම් සිදුකරන සියලුම කතුවරුන්ට ප්‍රශංසා කිරීමට මට අවශ්‍යයි. මේ කලාපයට වඩාත්ම අදාළ මාතෘකා පිළිබඳව පර්යේෂණ කිරීමට ඔබේ කැපවීම, දකුණු ආසියාවේ සහ ඉන්දියන් සාගරයේ ජනයා මුහුණ දෙන අභියෝග මාලාවක් විසඳීමට අපව තවත් එක් පියවරක් සමීප කරනවා. පාරිසරික ආරක්ෂාව, කලාපීය සහයෝගීතාවය සහ පාලනය, සාමය ගොඩනැගීම, නීල ආර්ථිකය, සාම්ප්‍රදායික වෙළඳාම සහ සාගර ආරක්ෂාව පිළිබඳ ඔබේ අධ්‍යයනයන් පිළිබඳව වැඩිදුර දැන ගැනීමට අපි සැවොම උනන්දුවෙන් සිටිනවා.

අද මෙහි සිටින සිසුන් සහ විද්වතුන් ඉන්දියාව, ජපානය, මාලදිවයින, නවසීලන්තය සහ ශ්‍රී ලංකාව වැනි දකුණු ආසියාවේ, නැගෙනහිර ආසියාවේ සහ ශාන්තිකර කලාපයේ විවිධ අධ්‍යයන ආයතන නියෝජනය කරනවා. ඔවුන් විශේෂඥ දැනුමක් ගෙන එනවා. නිදහස්, විවෘත, සම්බන්ධිත, සමෘද්ධිමත්, ආරක්ෂිත සහ ඔරොත්තු දෙන ඉන්දු-ශාන්තිකර කලාපයක් පෝෂණය කිරීම සඳහා අපගේ කැපවීම අවධාරණය කරන එක්සත් ජනපද ඉන්දු-ශාන්තිකර උපායමාර්ගයේ මූලික මූලධර්ම සමඟ ඔවුන්ගේ පර්යේෂණ මාතෘකා විශේෂයෙන් සමපාත වනවා.

ඉන්දියානු සාගර කලාපීය සංගමයේ අමාත්‍ය මණ්ඩලය සහ ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය දරන ගාලු කථිකාව ජාත්‍යන්තර සමුද්‍රීය සමුළුව අවසන් වූ ආසන්නයේ ම මේ සතියේ මෙම සමුළුව පැවැත්වීම කොතරම් නම් උචිතද? IORA හි දී

විදේශ අමාත්‍ය අලි සබ්රි බහුපාර්ශ්විකත්වය සහ රාජ්‍ය තාන්ත්‍රිකත්වය කෙරෙහි නොසැලෙන විශ්වාසයකින් සාමය, සමගිය සහ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීම ගැන කතා කළා. එමෙන්ම ගාලු කථිකාවේදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ඉන්දු ශාන්තිකර කලාපය නව නැගී එන ලෝක පිළිවෙලක් තුළ නිර්වචනය කරන්නේ කෙසේද යන්න සහ එය ආර්ථික හෝ ආරක්ෂක ගොඩනැගීමකට ගැලපෙන ආකාරය පිළිබඳව කතා කළා.

අපි එය කෙසේ නිර්වචනය කළත්, බයිඩ්න් ජනාධිපතිතුමා පවසා ඇති පරිදි, ඉන්දු ශාන්තිකර කලාපය නිමක් නැති විභවයන් සහිත විශාල කලාපයක්. සමුද්‍ර ආරක්ෂාව, ජාත්‍යන්තර වෙළෙඳාම සහ කලාපීය සම්බන්ධතාව වැනි ක්ෂේත්‍රවල දිශානතිය සහ සංවර්ධනය හැඩගැස්වීම සඳහා ශ්‍රී ලංකාවට ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ හැකි බව අපි කවුරුත් දන්නවා. මීට අමතරව, ඕනෑම හෝ සියලුම දකුණු ආසියාතික රටවල් සම්බන්ධ කරගනිමින් බහුපාර්ශ්වික කටයුතුවලට සත්කාරකත්වය ලබාදිය හැකි සහ අග්නිදිග සහ ඊසානදිග ආසියාවටද සම්බන්ධ විය හැකි නොබැඳි, මධ්‍යස්ථ රටක් ලෙස ශ්‍රී ලංකාවට ආඩම්බර වියහැකියි. මගේ වෘත්තීය ජීවිතයෙන් වැඩි කොටසක් අග්නිදිග සහ ඊසානදිග ආසියාවේ ගත කර ඇති මට, ලංකාවට පැමිණි විට තමයි බොහෝ දෙනෙක් දැනටමත් දන්නා දේ - ඇතැම්විට ශ්‍රී ලංකාව ඒ බව නොදැන සිටියත්, මෙරට තමන්ගේ බර පන්තියට වඩා ඉහළ මට්ටමකින් ක්‍රීඩා කරන ක්‍රීඩකයකු බව මට වැටහුණේ. එයින් අදහස් කරන්නේ අර්බුද මාදිලියෙන් මිදී, තිරසාර සහ සර්වග්‍රාහී ප්‍රතිසංස්කරණ ඇති කිරීමයි. එයින් අදහස් කරන්නේ හුදෙක් මුලපිරීම් හෝ ප්‍රතිපත්තිවලට ප්‍රතිචාර දැක්වීම පමණක් නොව, කලාපයේ රටවලට ක්‍රියාශීලීව වටිනා දෙයක් පිරිනැමීමට - තම අත්දැකීම්, නව්‍ය චින්තනය, මානව සම්පත් ධාරිතාව පිරිනැමීමට - ඇති හැකියාව පිළිබඳ ශ්‍රී ලංකාවට විශ්වාසය සහ අභිලාෂය ද ඇති බවයි.

කලාපීය උපාය මාර්ග සහ බහුපාර්ශ්වික වේදිකා, ඉන්දු- ශාන්තිකර කලාපය මුළුල්ලේ බලවත් සාමූහික බලපෑමක් ඇති කරමින්, ඔවුන්ගේ හඬ ඒකාබද්ධ කිරීමට පොදු වටිනාකම් සහ ඉලක්ක ඇති රටවලට අවස්ථාව සපයනවා. ශ්‍රී ලංකාව මෑතකදී සභාපතිත්වය භාරගත් බිම්ස්ටෙක්, සාර්ක්, ආසියාන් සහ IORA වැනි සංවිධාන ඒ සඳහා ඉතා ආසන්න උදාහරණ කිහිපයක් වනවා.  මෙවැනි සහයෝගීතා මුලපිරීම්, කලාපයේ විවිධත්වය සැමරීමට මෙන්ම භූ දේශපාලනය යනු තනි විජයග්‍රාහකයකු සිටිය යුතු ක්‍රීඩාවක් විය යුතු නැති බව පෙන්නුම් කිරීමට අපට පොළඹවනවා. සෑම විදේශ ප්‍රතිපත්ති තීරණයකදීම සෑම රටක්ම සතුටු කිරීමට උත්සාහ කළ යුතු යැයි මින් අදහස් වන්නේ නැහැ. එයින් අදහස් කරන්නේ ඔබේ පරමාධිපත්‍යයේ හිමිකාරිත්වය ගැනීම සහ පැහැදිලි ඇසින් තීරණ ගැනීමයි.

එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ අභිලාෂයන් සහ අරමුණු හඳුනාගෙන ඒවාට ගරු කරන බව මා ඔබට කියනවා. ශ්‍රී ලංකාව, තම වටිනාකම් සහ එහි ජනතාවගේ අවශ්‍යතා සහ අවශ්‍යතා සමඟ සමපාත වන තීරණ ගන්නා ලෝක වේදිකාවේ සමාන

රටක් ලෙස අපි හඳුනා ගන්නවා. ඇත්ත වශයෙන්ම, මෙම ද්විපාර්ශ්වික සබඳතාවල 75 වැනි සංවත්සරය තුළ අපගේ ද්විපාර්ශ්වික සබඳතාව සඳහා මග පෙන්වීමට එම මූලධර්ම උපකාරී වනවා.

ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය සහ ස්වාධීනත්වය සඳහා අපගේ සහයෝගය පිළිබඳ උදාහරණ කිහිපයක් බලමු. එක්සත් ජනපද ඉන්දු- ශාන්තිකර විධානය සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහයෝගී ප්‍රයත්නයක් වන ඉන්දු- ශාන්තිකර පාරිසරික ආරක්ෂක සංසදය විවෘත කිරීමේ ගෞරවය අගෝස්තු මාසයේදී මට ලැබුණා - අපි එක්ව සම සත්කාරකත්වය දැක්වූ පළමු අවස්ථාව මෙයයි. දේශගුණික විපර්යාස සහ ආරක්ෂාව වැනි ඉඩම් ආරක්ෂාව සහ ජාතික ඔරොත්තු දීමේ හැකියාවට බලපෑම්; සමුද්‍ර හා ජල ආරක්ෂාව; නාගරීකරණයේ ආරක්ෂක බලපෑම්; සහ කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව වැනි තීරණාත්මක මාතෘකා සාකච්ඡා කිරීම සඳහා රටවල් 28 කින් සහභාගී වූවන් 100 කට අධික පිරිසක් මේ සඳහා කොළඹට රැස් වුණා. දේශගුණික අර්බුදය අප සැමට බලපාන නමුත් එහි බලපෑම ශ්‍රී ලංකාව වැනි දූපත් රාජ්‍යයන්ට විශේෂයෙන් දරුණු වනවා. යහපරිච බෙදාහදා ගැනීම, තිරසාර හමුදා මෙහෙයුම් දිරිගැන්වීම සහ පාරිසරික ආරක්ෂණ අභියෝග සහයෝගීව ආමන්ත්‍රණය කිරීම මගින් මෙවැනි වැඩසටහන් ඉන්දු- ශාන්තිකර කලාපයේ වගකීමෙන්යුත් භාරකාරීත්වය පෝෂණය කරනවා.

සමුද්‍රීය ආරක්ෂාව සහ සමුද්‍රීය බලප්‍රදේශ දැනුවත්භාවය සම්බන්ධයෙන් ගත් කල, සමුද්‍රීය ස්වෛරීභාවය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ධාරිතාව වැඩි දියුණු කිරීම සහ පුළුල් කිරීම සම්බන්ධයෙන් එක්සත් ජනපදය ඉදිරියෙන් ම සිටිනවා. ආර්ථික සම්පත් ආරක්ෂා කර ගැනීමට සහ භෞමික ජල තීරයේ සහ විශේෂ ආර්ථික කලාපයේ අන්තර්ජාතික අපරාධ ක්‍රියාකාරකම්වලට ප්‍රතිචාර දැක්වීමට ශ්‍රී ලංකාවට උපකාර වන සම්පත් සහ යහපරිච අපි බෙදාහදාගෙන තිබෙනවා. මුහුදු කොල්ලකෑම්, ආයුධ සන්නද්ධව මුහුදේ මංකොල්ලකෑම් සහ ජාවාරම් යන සියල්ල සමුද්‍රීය ආරක්ෂාව පිරිහීමට ලක් කරනවා. නීති විරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීම අනාගත පරම්පරාවේ සමෘද්ධිය සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන සමස්ත කලාපයේ නීල ආර්ථිකයට තර්ජනය කරනවා. එක්සත් ජනපද රජය විසින් ශ්‍රී ලංකා නාවික හමුදාවට යාත්‍රා තුනක් පරිත්‍යාග කර ඇති අතර, පසුගිය නොවැම්බරයේ ශ්‍රී ලංකා ධජය යටතේ සිය මෙහෙයුම් ආරම්භ කළ විජයබාහු නෞකාව, එඩාත් මෑතකාලීනව එසේ ලබාදුන් නෞකාවයි.  නාවුක බලඇණිය ශක්තිමත් කිරීමේ මෙම ප්‍රයත්න හරහා අවධාරනය කරන්නේ, බලහත්කාරය සහ නපුරු ක්‍රියාකාරීන්ගේ තර්ජන මැඩලීමට හැකි ශක්තිමත් සහ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් සඳහා අපගේ නොසැලෙන සහයෝගයයි.

ශ්‍රී ලංකාව සෞභාග්‍යය කරා යන ගමනේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරන නීල ආර්ථිකය ගැන මම සඳහන් කළා. තිරසාර නීල ආර්ථිකයන් සඳහා ආයෝජනය කිරීම ආර්ථික සංවර්ධනය දිරිගන්වන අතර පාරිසරික ආරක්ෂාව සහ ආර්ථික වර්ධනය

අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් කරන ආකාරය පෙන්නුම් කරනවා. ශ්‍රී ලංකාව උපායමාර්ගිකව පිහිටා ඇත්තේ ලෝකයේ කාර්යබහුලම නැව් මංතීරු මධ්‍යයේ වන අතර සියලුම බහාලුම් නැව්වලින් අඩක් සහ තෙල් නැව්ගත කිරීම්වලින් තුනෙන් දෙකක් ගමන් කරන්නේ එම මාර්ගයේයි. ගෝලීය භාණ්ඩ වෙළඳාම විවෘත මුහුදක් හරහා නිදහසේ ගලා යා හැකි බව සහතික කිරීම ශ්‍රී ලංකාවට පමණක් නොව, වෙළඳ හා ආර්ථික සංවර්ධනයට සහාය වීම සඳහා තම භාණ්ඩ නියමිත වේලාවට ලබා දීම මත යැපෙන ලෝකයේ සෙසු ආර්ථිකයන්ට තීරණාත්මක සාධකයක් වනවා. ඉන්දු ශාන්තිකර කලාපය මුළුල්ලේ ශ්‍රී ලංකාව සහ අනෙකුත් ජාතීන් සඳහා සමෘද්ධිමත් නීල ආර්ථිකයක් සහතික කිරීමට එක්සත් ජනපදය කැපවී සිටිනවා. 2022 දී ඉන්දු-ශාන්තිකර ක්‍රමෝපාය දියත් කිරීමේ සිට, USAID හරහා සිදුකරන ආර්ථික සංවර්ධනය, එ.ජ. ජාත්‍යන්තර සංවර්ධන මූල්‍ය සංස්ථාවේ මූල්‍යකරණය, Millennium Challenge Corporation ගිවිසුම, ධාරිතා ගොඩනැගීම, ආරක්ෂක ක්ෂේත්‍රය තුළ, සහ ගෝලීය සෞඛ්‍ය සහ දේශගුණික ඔරොත්තු දීමේ ආධාර යන ආකාර හරහා ඉන්දු-ශාන්තිකර ප්‍රමුඛතා සඳහා එක්සත් ජනපද රජය ඩොලර් බිලියන 2කට අධික විදේශ ආධාර ප්‍රමාණයක් කැප කර තිබෙනවා.

රටක් ස්වෛරීභාවය, විනිවිදභාවය, යහපාලනය, සංවේදී ප්‍රතිසංස්කරණ සහ ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයෙන් සියලු පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගැනීමට ප්‍රමුඛත්වය දෙන විට, ශ්‍රී ලංකාවට ඉන්දු ශාන්තිකර කලාපයේ ඉටුකළ හැකි තීරණාත්මක කාර්යභාරයේ විභවය නිමක් නැහැ. අද ඉදිරිපත් කිරීම් සිදුකළ අයගේ පර්යේෂණ සහ න්‍යායන් වෙත අප සවන් දුන්නා. එක්සත් ජනපදය ශ්‍රී ලංකාව සමඟ උරෙන් උර ගැටී, ඔබ සහ ඔබේ ජාතීන් සමඟ, අභිලාෂකාමී වීමට, සහයෝගීව වැඩ කිරීමට වඩාත් සාමකාමී, සමෘද්ධිමත් සහ ඔරොත්තු දෙන ඉන්දියානු සාගර කලාපයක් සඳහා අපගේ හවුල් දැක්ම තවදුරටත් ඉදිරියට ගෙන යෑමට ක්‍රම සොයනු ඇත. ස්තූතියි.